www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාව සමග ප්‍රධාන මූලෝපායික "සබඳතාවක්" ඇති කර ගැනීමට බුෂ් දකුනු ආසියාවට ගමන් කරයි

**Bush travels to South Asia in pursuit of key strategic "partnership" with India**

**කීත් ජෝන්ස් විසිනි**
**2006 පෙබරවාරි 28**

ඉන්දියාව සමග ''ගෝලීය'' හා මූලෝපායික හවුලක් තහවුරු කර ගැනීමේ එල්ලය සහිතව ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් ඩබ්. බුෂ් මෙම සතියේ දකුනු ආසියාවට ගමන් කරයි. ඔහුගේ කාර්යාලීය සහකරුවන්ට අනුව මෙම ගමන ඔහුගේ සමස්ත ජනාධිපති ධුර කාල පරිච්ඡේදය තුල යෙදුනු අතිශයින් ම වැදගත් දූත ගමන් අතරින් එකකි.

අතිශයෝක්තීන් පසෙකින් තැබූ විට බුෂ් පරිපාලනය සතුව එකිනෙකට සහසම්බන්ධිත අරමුනු දෙකක් තිබේ.

පලමුව, ඉන්දියාවේ වේගයෙන් පුලුල් වන්නා වූ ආර්ථිකය තුල මූලික වූත් නො නැවතී පැතිරෙන්නා වූත් කාර්ය භාරයක් කෝපරේට් ඇමරිකාව විසින් ඉටු කරනු ලබන බවට සහතික කර ගැනීම ඊට අවශ්‍ය ය. නිර්යාතයන් කරා යොමු වුනු තොරතුරු තාක්ෂන හා ව්‍යාපාරික-ක්‍රියාවලි ක්ෂේත්‍රයන්හි ලාභ ශ්‍රමය සූරා කන්නා ලෙසත්, ලෝක ධනපති ආර්ථිකය සමග එය වඩාත් තදින් ඒකාග්‍ර කිරීම සඳහා අවශ්‍ය වන ගමනාගමන හා බලශක්ති යටිතල පහසුකම් සැපයීම එල්ල කර ගනිමින් රාජ්‍ය-පුද්ගලික හවුල්වල (පීපීපී) පාර්ශ්වකරුවකු ලෙසත්, ඉන්දියාවේ දලු ලා වැඩෙන මිලිටරියට ආයුධ හා ආයුධ පද්ධතීන් සපයන්නෙකු ලෙසත් මෙම කාර්ය භාරයන් පෙන්වා දිය හැකි ය.

ඉන්දියාවේ සිල්ලර වෙලඳ ක්ෂේත්‍රය හොර රහසේ විවෘත කර ගැනීම බුෂ් පරිපාලනයේ සුවිශේෂී අවශ්‍යතාවකි. මෙම ක්ෂේත්‍රයේ කුඩා, අවිධිමත් ව්‍යාපාරයන්හි පවතින දසලක්ෂ සංඛ්‍යාත රැකියා, වෝල් මාට් වැනි සමාගම්වල පූර්න කාලීන, නියමාකාර රැකියා බවට පත් කර ගැනීම ද, සියයට 60ක් ඉන්දියානුවන්ගේ ජීවනෝපාය සපයන කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල කෘෂි-ව්‍යාපාරික දැවැන්ත සමාගම් වන මොන්සන්ටෝ ආදියට වඩ වඩාත් ඉඩ ප්‍රස්තාව ලබා ගැනීම ද මෙම අවශ්‍යතාවන්ට ඇතුලත් ය.

''නිදහස් වෙලඳ පොල'' හරහා විශිෂ්ට අයුරින් සාර්ථකත්වයට පත් වූ ඉන්දියාවේ දල දේශීය නිෂ්පාදිතයේ නැගීම පදනම් කර ගනිමින් බුෂ් තැරැවිකාරකමේ යෙදුන ද, ඉන්දියාවේ ජාතික වසයෙන් හසුරුවනු ලැබූ ආර්ථිකය පශ්චාත් 1991 කාලය තුල බිඳ විසුරුවා දැමීම අත්වැල් බැඳ ගෙන ඇත්තේ වේගයෙන් වර්ධනය වන සමාජ අසමානත්වය හා ආර්ථික අනාරක්ෂාව සමග ය. ''ප්‍රජාතන්ත්‍රවාදී ඉන්දියාව'' තුල දසලක්ෂ සිය ගනන් ජනයා දිනකට ඩොලර් 1ට අඩු ආදායමකින් ජීවිතය පවත්වා ගැනීමට අරගලයක නිරත වන අතර අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවයේ සියලු එල්ලයන් හා අංශයන් පුද්ගලීකරනය කර ඇත. ගරා වැටුනු නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවය දුප්පතුන්ගේත් දුප්පතුන් විසින් පමනක් භාවිත කෙරේ.

බුෂ්ගේ ගමනෙහි දෙවන හා වඩාත් වැදගත් එල්ලය වන්නේ වැඩි දියුනු කෙරෙන මිලිටරිය, න්‍යෂ්ටික සිවිල් අංශය හා භූ-දේශපාලනික සහයෝගිතාව හරහා ගෝලීය සුපිරි බලවත් බව සඳහා සිය එල්ලයේ දී ඉන්දියාව යොදා ගැනීම යි. කෙටියෙන් කිව හොත් ''නැගී එන ඉන්දියාව,'' ආර්ථික, මිලිටරි හා භූ-දේශපාලනික ප්‍රතිතෝලකයන් ලෙස චීනයට එරෙහිව යොදා ගැනීම එක්සත් ජනපදයේ අවශ්‍යතාව යි.

ඉන්දියාව ''ලෝක බලයක්'' වීම සඳහා උදව් කිරීමට එක්සත් ජනපදයට අවශ්‍ය බව පසු ගිය මාර්තුවේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ප්‍රසිද්ධියේ නිවේදනය කලා ය. අනතුරුව මිලිටරි සහයෝගිතාව පුලුල් කිරීම අරමුනු කර ගනිමින් වොෂින්ටනය හා නව දිල්ලිය ගිවිසුම් ගනනාවකට මුල පිරී ය. එක්සත් ජනපද උසස් මිලිටරි උපකරන විකිනීම හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අවසරයෙන් තොරව ඒකාබද්ධ විදේශ මැදිහත් වීම් ඊට අයත් ය.

ලෝක බලයක් ලෙස පිලිගැන්මට ලක් වීමට ඉන්දියානු සුපිරි පාලක පන්තියට පවතින ලොල් බව යොදා ගැනීමේ හා සිය කොල්ලකාර විදේශ ප්‍රතිපත්තියට ප්‍රජාතාන්ත්‍රික ඔපයක් දීමේ උත්සාහයක යෙදෙමින් බුෂ් පරිපාලනය විසින් යෝජනා කරනු ලැබ ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී පෙරමුන (යූපීඒ) ආන්ඩුව පිලිගත් කරුනක් වූයේ ආසියාව තුල හා ලෝකය වටා ''ප්‍රජාතන්ත්‍රවාදයට'' අනුබල දීම සඳහා එක්සත් ජනපදය හා ඉන්දියාව එක්ව ක්‍රියාත්මක වන්නා වූ එක්සත් ජනපද-ඉන්දියානු ගෝලීය ප්‍රජාතාන්ත්‍රික ප්‍රවේශයක් බිහි කිරීම යි. (එවන් සහයෝගිතාවක් සඳහා පවතින ආදර්ශය නම් ඇෆ්ඝනිස්ථානය යි. 2001 එක්සත් ජනපදය විසින් ඇෆ්ඝනිස්ථානය යටත් කර ගනු ලැබීමට ඉන්දියානු ආන්ඩුවේ අනුමැතිය ලැබීම හා එක්සත් ජනපදය විසින් අටවනු ලැබූ ආන්ඩුව එතැන් පටන් ඉන්දියාවේ දේශපාලනික හා මූල්‍ය සහයෝගය පුලුල් ලෙස භුක්ති විඳීම පෙන්වා දිය හැකි ය.)

කෙසේ වුව ද එක්සත් ජනපදයේ ගෝලීය භූ-දේශපාලනික උපායන්ට හා අභිලාෂයන්ට අනුව බුෂ් පරිපාලනයේ එල්ලයන් මුදුන්පත් කර ගැනීමට ඉන්දියාව මෙහෙයවා ගැනීමේ අතිශයින් ම කේන්ද්‍රීය වූ ගිවිසුම, යෝජිත ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම වෙයි.

ඉන්දියානු අගමැති මන්මෝහන් සිං පසු ගිය ජුලි මස වොෂින්ටනයට පැමිනි අවස්ථාවේ දී ඇති කර ගත් න්‍යෂ්ටික ගිවිසුම මගින් පිලිගත් න්‍යෂ්ටික-ආයුධ රාජ්‍යයන්ගේ සංගමයට ඇතුලු වීමට ඉන්දියාවට ක්‍රියාකාරී අනුග්‍රහයක් ලබා දීමට එක්සත් ජනපදයට කැඳවුම් කෙරේ. මෙම ගිවිසුමට අනුව ලෝක න්‍යෂ්ටික පාලන තන්ත්‍රය තුල ඉන්දියාවට සුවිශේෂී තත්වයක් ලබා දීමට න්‍යෂ්ටික සැපයුම් කන්ඩායමේ සාමාජික රටවලට වොෂින්ටනය බලපෑම් කල යුතු ය. න්‍යෂ්ටික පැතිරීම නැවැත්වීමේ ගිවිසුම (මෙමගින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මන්ඩල රාජ්‍යයන් පහෙහි න්‍යෂ්ටික ඒකාධිකාරය ආරක්ෂා කෙරේ) අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරමින් හා ජාත්‍යන්තර අවශ්‍යතාවන් උල්ලංඝනය කරමින් 1998 දී ස්වයං-සපථ කර ගැනීමකින් න්‍යෂ්ටික ආයුධ සහිත බලයක් බවට පත් වූ ඉන්දියාවට මෙමගින් උසස් සිවිල් න්‍යෂ්ටික තාක්ෂනය හා න්‍යෂ්ටික ඉන්ධන වෙත සමීප වීමට ඉඩප්‍රස්තාව ලැබේ.

න්‍යෂ්ටික ආයුධ සහිත රාජ්‍යයක් ලෙස ජාත්‍යන්තර පිලිගැනීමක් ඇති කර ගැනීමට ඉන්දියාව උත්සුක වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක කවුන්සිලයේ ස්ථිර ආසනයක් සඳහා වන එහි ඉල්ලීමට ඉන් ලැබෙන පිටුවහල නිසාත් ඒ හැරුනු විට සුපිරි හෝ ලෝක බලයක තත්වය එමගින් ලැබෙන නිසාත් ය. සිවිල් න්‍යෂ්ටික බලය නිපදවීමේ හැකියාව පුලුල් කර ගැනීම සඳහා විදේශීය තාක්ෂනය හා ඉන්ධන ලබා ගැනීමට එය උත්සුක වන්නේ එමගින් විදේශීය තෙල් හා ගෑස් ආයාතනයන් මත විශාල වසයෙන් යැපීම අඩු කොට සිය න්‍යෂ්ටික වැඩ පිලිවෙලෙහි පවතින සම්පත් මිලිටරි පරීක්ෂන හා වර්ධනය සඳහා නිදහස් කර ගැනීමට ය.

ජනාධිපතිගේ ඉන්දියානු ගමනෙහි මූලික එල්ලය න්‍යෂ්ටික ගිවිසුමෙහි අවසන් පිටපත අත්සන් කිරීම බව බුෂ් පරිපාලනයේ නිලධාරීහු පෙන්වා දුන්හ. එනමුදු පසු ගිය ජුලියේ ඇති කර ගත් ගනුදෙනුව දැන් බේරුම් කිරීමේ අනතුරකට ලක්ව ඇත. රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දෙවැනියා වන නිකොලස් බර්න්ස් පසු ගිය සතියේ ඉන්දියාවේ සිට නිවස බලා පැමිනියේ එහි සැලකිය යුතු ''වෙනස්කම් තව මත් පවතින බව'' පිලිගැනීමෙන් අනතුරුව ය.

න්‍යෂ්ටික ගනුදෙනුවක් සම්පූර්න කර ගැනීමට පවතින පැහැදිලි අසමර්ථතාව ගනන් ගත යුත්තක් නොවන බවට පහත හෙලීමට මුද්‍රිත මාධ්‍යයන්ට කතා කරමින් බුෂ්ගේ ජාතික ආරක්ෂක උපදේශක ස්ටෙෆාන් හැඩ්ලි පසු ගිය සිකුරාදා උත්සාහ දැරී ය. ''මේ දැන් එක්සත් ජනපදය හා ඉන්දියාව අතර පවතින සම්බන්ධතාව අතිශයින් පුලුල් හා පොහොසත්'' බව හැඩ්ලි කීවේ ය. ''මෙම එකඟතාව තිබිය යුතු ද නොමැති ද යන්න පිලිබඳව නායකයන් දෙදෙනා ම (බුෂ් හා ඉන්දීය අගමැති මන්මෝහන් සිං) කතා කල යුතු බොහෝ දේ ඇත.''

## එක්සත් ජනපද හිරිහැර හා උපාමාරු

ගිවිසුම ගිලිහීමේ අනතුරට ලක්ව ඇත් නම් එසේ වී ඇත්තේ ගිවිසුම රුදුරු ලෙස යොදා ගනිමින් බලාත්කාරයෙන් ඉන්දියාව තම වුවමනාවන්ට යොදා ගැනීමට හා තාක්ෂනික-මිලිටරි පරාධීනත්ව සම්බන්ධතාවක උගුලකට හසු කිරීමට එක්සත් ජනපදය ඉතා වේගයෙන් ක්‍රියාත්මක වීම නිසා ය. ඉන්දියාව සමග පැවති විවාහපේක්ෂිත ප්‍රචන්ඩකාරී කාල පරිච්ඡේදය නිමා වීමටත් පෙර දූෂ්‍ය ස්වාමිපුරුෂයෙකුගේ ක්‍රියා කලාපය ආරූඪ කර ගත් වොෂින්ටනය, ඉන්දියාවට පරිභව කරමින් හා හිරිහැර කරමින් යෝජිත විවාහ ගිවිසුම යලි ලිවීමට උත්සාහ දැරී ය.

ඉරානයට එරෙහිව පීඩනය යෙදීමේ එක්සත් ජනපදයේ හා එහි යුරෝපා සංගමයේ සගයන්ගේ ව්‍යාපාරය සඳහා ඉන්දියාවේ සහයෝගය ඉල්ලා සිටිමින් එක්සත් ජනපද නිලධාරීන් හා කොන්ග්‍රස් සභිකයන් විසින් යලි යලිත් න්‍යෂ්ටික ගිවිසුම ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරනු ලැබිනි. පසු ගිය සැප්තැම්බරයේ හා මේ මස මුල දී ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති ඒජන්සියේ (අයිඒඊඒ) ප්‍රධාන ඡන්ද විමසීමේ දී ඉරානයට එරෙහිව වොෂින්ටනය සමග ඡන්දය පාවිච්චි කරමින් ''වගකීම්

දරන'' න්‍යෂ්ටික බලයක් ලෙස තම අවංක බව තහවුරු කරන ලෙස එක්සත් ජනපද නිලධාරීන් ඉන්දියාවට බල කලේ ය.

න්‍යෂ්ටික ගිවිසුම හා ඉරානය සමග ඉන්දියාවේ සම්බන්ධතාවන් අතර කිසි ම සම්බන්ධයක් නැති බවත් කිසි ම විටක නො තිබි බවත් එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුව මුරන්ඩු ලෙස තහවුරු කල ද මෙම ප්‍රකාශයන් යටපත් කෙරෙන ප්‍රසිද්ධ ප්‍රකාශයන් බුෂ් පරිපාලනය තුල හා ඒ වටා සිටින පුද්ගලයන් විසින් වරින් වර ඉදිරිපත් කෙරිනි.

පාර්ලිමේන්තු ජාත්‍යන්තර සබඳතා කමිටුවේ ප්‍රධාන ඩිමොක්‍රැටික් පාක්ෂිකයෙකු වූ ද බුෂ් පරිපාලනයේ සමීප සගයෙකු වූ ද ටොම් ලැන්ටොස් ප්‍රකාශ කලේ, ''ජාත්‍යන්තර සබඳතාවන්ගේ දී වන්දි දීමක් තිබේ. ඉන්දියාවට ගැලපෙන අයුරින් අප අප දඟර විස්කෝතුවක් බවට පත් කර ගන්නේ නම් ඉරානය පිලිබඳ එක්සත් ජනපද ප්‍රතිපත්තිය වැනි තීරනාත්මක ක්ෂේත්‍රයන්ගේ එක්සත් ජනපද ක්‍රියා මාර්ගයන් පිලිබඳව ඉන්දියාව සැලකිලිමත් විය යුතු ය යන්න පිලිබඳව නොවරදින සහතික වීමක් මට අවශ්‍ය ය.''

සමහර විට සියල්ල අතුරින් වඩාත් ම මුරන්ඩු හා ප්‍රකෝපකාරී ප්‍රකාශය වූයේ, ඉන්දියාවේ එක්සත් ජනපද ආන්ඩුවේ නිල නියෝජිතයා වූ තානාපති ඩේවිඩ් මුල්ෆෝඩ් පසුගිය මාසයේ කල ප්‍රකාශය යි. එලඹෙන ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති ඒජන්සි (අයිඒඊඒ) රැස්වීමේ දී ඉරානයට එරෙහිව එක්සත් ජනපදය සමග ඡන්දය පාවිච්චි නො කල හොත් න්‍යෂ්ටික ගිවිසුම ''මරනයට'' පත් විය හැකි බව ඔහු කියා සිටියේ ය. ඉන්දියානු ආන්ඩුව විරෝධතා කෙඳිරිල්ලක් වාර්තා කල පසුව මුල්ෆෝඩ්ගේ ප්‍රකාශය සමග සම්බන්ධයක් නැති බව ප්‍රකාශ කිරීමට බුෂ් පරිපාලනයට සිදු වූ නමුදු ටික දිනකට පසුව රාජ්‍ය ලේකම් රයිස් මෙම පනිවුඩය යලිත් ඉදිරිපත් කලේ ය. ''සිවිල් න්‍යෂ්ටික බලය ලබා ගැනීමේ නව අදියරට ලඟා වීම සඳහා ඉන්දියාව යම් දුෂ්කර තෝරා ගැනීම් කල යුතු ය.''

නව දිල්ලිය සමග පවතින සබඳතා තව දුරටත් උග්‍ර වීම හා එක්සත් ජනපදය සමග ගිවිසුම පිලිබඳව ඉන්දියානු විරුද්ධ පාර්ශ්වය ඇවිලවීම සිදු වන්නේ යෝජිත ඉරාන-පකිස්ථාන-ඉන්දියා ගෑස් නල මාර්ගය නැවැත්වීම සඳහා අතිශයින් ම ප්‍රසිද්ධ ව්‍යාපාරයක් වොෂින්ටනය විසින් ගෙන යනු ලැබීමෙනි. නල මාර්ග ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට නව දිල්ලිය ඉතා ඕනෑකමින් උනන්දු වන්නේ ඊට පවතින දැවෙන බලශක්ති අවශ්‍යතාව නිසා පමනක් නො ව පකිස්ථානය සමග මෑත දී ඇරඹුනු සාම ක්‍රියා දාමයට ද එය මුක්කුවක් සපයන බැවිනි.

ඉන්දියාවේ හා චීනයේ තිබෙන රාජ්‍යයට අයත් විශාලතම තෙල් සමාගම් විසින් සිරියාවේ බලශක්ති දේපලක් හවුලේ මිලට ගැනීමට එරෙහිව රාජ්‍ය තාන්ත්‍රික මංපෙත් ඔස්සේ ඉන්දියාවට විරුද්ධත්වය පැමට පවා එක්සත් ජනපද නිලධාරීන් ක්‍රියා කිරීම මගින් සංඥා කෙරෙන්නේ ඉන්දියාව බලශක්තිය මිලට ගත යුත්තේ කාගෙන් ද යන්න පිලිබඳව නියෝග කිරීමට එක්සත් ජනපදයට පවතින අවශ්‍යතාව පමනක් නො ව ඉන්දු-චීන සහයෝගිතාව වැලැක්වීමට ද එය ඉටා ගෙන ඇති බව යි.

උසස් තාක්ෂනික මිලිටරි උපකරන විකිනීම සමගින් පරාධීන සබඳතාවක උගුලකට ඉන්දියාව හසු කිරීමට න්‍යෂ්ටික ගිවිසුම යොදා ගනිමින් එක්සත් ජනපදය ක්‍රියා කරනු ඇතැයි යන පදනම මත ඉන්දියානු දේශපාලන හා මිලිටරි සංස්ථාපිතයේ කොටසක් මුල සිට ම ඊට විරුද්ධ විය. තහංචි පැනවීම හා උසස් එක්සත් ජනපද තාක්ෂනය ලබා ගැනීම වැලැක්වීම මගින් ඉන්දියාවට පීඩනය යෙදීමේ දීර්ඝ ඉතිහාසයක් එක්සත් ජනපදයට ඇති බව මෙම විවේචකයෝ පෙන්වා දෙති.

ඉන්දියාවේ න්‍යෂ්ටික මිලිටරි බලයෙහි පූර්නත්වය හා ස්වාධීනත්වය රැක ගැනීම සඳහා ගනුදෙනුව අවලංගු කල යුතු බවට තර්ක කරමින් නිල විරුද්ධ පාර්ශ්වය වන හින්දු ස්වෝත්තමවාදී හා සාම්ප්‍රදායිකව අතිශයින් එක්සත් ජනපද ගැති වූ භාරතීය ජනතා පක්ෂය හා ඉන්දියානු මිලිටරි-විද්‍යාත්මක සංස්ථාපිතයේ පුලුල් කොටසක් මෑත සතිවල දී මොවුන් සමග ඒකාබද්ධ වූහ. න්‍යෂ්ටික ගිවිසුමෙහි සූක්ෂ්ම අංශ පිලිබඳ කේවෙල් කිරීම් හා සුවිශේෂ වසයෙන් ඉන්දියාවේ න්‍යෂ්ටික අංශය ජාත්‍යන්තර අධීක්ෂනයට යටත් සිවිල් වැඩ පිලිවෙලකට හා ආවෘත මිලිටරි වැඩ පිලිවෙලකට බෙදීමට කරන යෝජනාව, ඉන්දියාව මත උපාමාරු යෙදීමටත් එහි න්‍යෂ්ටික ආයුධ සංචිතය වර්ධනය කිරීමේ හැකියාව සීමා කිරීමටත් එක්සත් ජනපදය විසින් යොදා ගනු ලබන බවට විද්‍යාඥයෝන් චෝදනා කරති. ඉන්දියාවේ න්‍යෂ්ටික ශක්තිය, ජාත්‍යන්තරව පිලිගැනුනු න්‍යෂ්ටික රාජ්‍යවලට වඩා ජාත්‍යන්තර අධීක්ෂනයන්ට ලක් විය යුතු යැයි එක්සත් ජනපදය අවධාරනය කරන බව විද්‍යාඥයෝ පවසති.

න්‍යෂ්ටික ගිවිසුම පිලිබඳ කේවෙල් කිරීම්වල දී ''එලඹීමට ගිවිස ගැනෙන එල්ලයන් යලි යලිත් සංශෝධනය කරන බවට'' මේ මස මුල දී එක්සත් ජනපදයට චෝදනා කල ඉන්දීය න්‍යෂ්ටික බලශක්ති කොමිසමේ සභාපති හා න්‍යෂ්ටික බලශක්ති දෙපාර්තමේන්තුවේ ලේකම් අනිල් කකෝද්කාර්, ඉන්දියාවේ ශීඝ්‍ර උපජනන න්‍යෂ්ටික වැඩ පිලිවෙල ජාත්‍යන්තර අධීක්ෂනයට විවෘත කල යුතු ය යන එක්සත් ජනපද පීඩනය මත (ඉන්දියාවේ) එක්සත් ප්‍රගතිශීලී

සන්ධාන (යූපීඒ) ආන්ඩුව බිඳීමකට ලක් වුව හොත් ඉන්දියාවේ න්‍යෂ්ටික වැඩ පිලිවෙලෙහි ස්වාධීනත්වය පවත්වා ගැනීමට නොහැකි වනු ඇතැයි අනතුරු ඇඟවී ය. ''මින් ඇති කෙරෙන්නේ බාධාකාරී තත්වයක්'' බව කකෝද්කාර් ඉන්දියන් එක්ස්ප්‍රස් පත්‍රයට කියා සිටියේ ය.

යූපීඅයි මාධ්‍ය ඒජන්සියට අනුව, ජොෂ්ඨ ඉන්දියානු ආරක්ෂක නිලධාරියෙකු සකස් කල සටහනක න්‍යෂ්ටික ගිවිසුම ගුනාංගීකරනය කෙරෙන්නේ ''දෙපිලට ම පරාජය අත් වන තත්වයක්" ලෙස ය. සටහන අවධාරනය කරන්නේ න්‍යෂ්ටික ගිවිසුම හරහා එක්සත් ජනපදය උත්සාහ දරන්නේ ''ඉන්දියාවේ ස්වදේශික න්‍යෂ්ටික වැඩ පිලිවෙල ජාත්‍යන්තර පරමානු බලශක්ති ඒජන්සිය යටතේ අගුලු දැමීම; අවම නිවාරක හැකියාවක් අත් කර ගැනීමට දරන ඉන්දීය ප්‍රයත්නය හැල්ලු කිරීම; හා ඉන්දියාවේ න්‍යෂ්ටික බලශක්තිය එක්සත් ජනපදය මත යැපෙන තත්වයට පත් කිරීම යනාදියට වන බව යි.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ ස්ථිර ආසනයක් සඳහා ඉන්දියාවේ ඉල්ලීම අනුමත කිරීම එක්සත් ජනපදය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම ඉන්දීය දේශපාලන හා මිලිටරි/භූ-දේශපාලනික කවවල අවධානයෙන් ඉවත් වී නොමැති බව ද සඳහන් කල යුතු ය. එනමුදු චීනයට සීමා පැනවීමේ හා දුෂ්කරතාවට ලක් කිරීමේ එක්සත් ජනපදයේ අනෙකුත් ආසියාතික කඩඇනය වන ජපානයේ ඉල්ලීම එය අනුමත කලේ ය. නව දිල්ලිය හා වොෂින්ටනය අතර සබඳතාව වැඩි වැඩියෙන් සමීප වීම පිලිබඳව තදින් විවේචනශීලී බවක් දැක්වූ එක් ඇමතිවරයෙකු (මනි ෂංකර් අයියර්) තනතුරින් පහත දමමින් හා තවෙකෙකු (නත්වාර් සිං) කැබිනෙට්ටුවෙන් ඉවත් කරමින් ඉන්දියානු අගමැති මන්මෝහන් සිං හා කොන්ග්‍රස් පක්ෂ සභාපති සෝනියා ගාන්ධි ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගනුදෙනුව සඳහා තියුනු උත්සාහයක් දැරී ය.

එසේ වුව ද, තම ශීඝ්‍ර උපජනක ප්‍රතික්‍රියාකාරක වැඩ පිලිවෙල ජාත්‍යන්තර න්‍යෂ්ටික ආරක්ෂනයන්ට ලක් කිරීම ඉන්දියාව නොපිලිගන්නා බව සඳුදා පාර්ලිමේන්තු කතාව තුල දී පවසමින් එක්සත් ජනපද විධානයන් පිලිබඳ සමහර විවේචනයන් අනුමත කරන බවක් මන්මෝහන් සිං පෙන්වා සිටියේ ය.

චීනයට එරෙහිව ප්‍රතිතෝලකයක් ලෙස ඉන්දියාව යොදා ගැනීමේ එක්සත් ජනපද මූලෝපායික එල්ලය පිලිබඳව ඉන්දියානු සුපිරි පාලක පන්තිය අතිශයින් ම දැනුවත් ය. ඉන්දියාවේ භූ-දේශපාලනික භූමිකාව වොෂින්ටනයේ විධානයන්ට යටත් කිරීමට ප්‍රතිරෝධය දැක්වීමට ඉන්දියානු ධනේශ්වරය බොහෝ විට අධිෂ්ඨානවත්ව සිටීමට හේතු වන කරුනු දෙකක් පෙන්වා දිය හැකි ය. ඒවා නම් උතුරින් සිටින තම දැවැන්ත අසල්වාසියා සමග විනාශකාරී විය හැකි හබයකට පැටලීම දක්වා තල්ලු වීමට ඇති අකමැත්ත හා ලෝක වේදිකාව මත උපාමාරු දැමීමට ඇති ඉඩකඩ වොෂින්ටනය විසින් අහුරා දමනු ලැබීමට ඇති අකමැත්ත වේ.

වොෂින්ටනය සමග වඩාත් සමීප සබඳතාවක් ඇති කර ගැනීමට යත්න දරන අතරෙහි ම වුව ද, මෝස්කෝව සමග සිය දිගු කාලීන සබඳතාවන්, සුවිශේෂව මිලිටරි සබඳතාවන්, යලි පන ගැන්වීමට හා බීජිනය සමග සබඳතාවන්ගේ මූලික වෙනසක් ඇති කර ගැනීමට නව දිල්ලිය උත්සාහ දරයි.

එක්සත් ජනපදය සමග වෙලඳාම 2000 හා 2005 අතර කාලයේ දී සියයට 63 කින් වර්ධනය වන අතරෙහි ඉන්දු-චීන වෙලඳාම පුපුරනසුලු අයුරින් සියයට 500කින් ඉහල නැග ඉන්දියානු වෙලඳ සගයන් අතුරින් එක්සත් ජනපදයට පිටුපසින් වූ දෙවන ස්ථානයට චීනය පත් වී තිබේ. චීනය හා ඉන්දියව යන දෙරට ම බලශක්ති ආනයන මත යැපෙන තතු තුල තෙල් හා ගෑස් මත ගැටුම් ඇති වීමට තිබෙන හැකියාව පිලිබඳව දැනුවත්කමින් යුතුව, ඒකාබද්ධ ගවේෂන ව්‍යාපාරයන් ද ඇතුලු අවස්ථාවල දී එදිරිවාදුකම් වලක්වා ගැනීම සඳහා, බීජිං හා නව දිල්ලිය විසින් සමහර කුඩා පියවරයන් ගනු ලැබ ඇත. එක්සත් ජනපද රහස් තොරතුරු ලියවිල්ලකට අනුව ලෝක භූ-දේශපාලනික ක්‍රමය තුල ''පැද්දෙන රාජ්‍ය'' බවට පත් වීමේ ඉහලතම හැකියාව ඉන්දියාවට පවතින තතු තුල එක්සත් ජනපදයට, චීනයට හා අනෙකුත් මහා බලවතුන්ට එක් වර එය හැසිරවීමට ඉඩ දීම මගින් ඉන්දියාවේ අවශ්‍යතාවන් සපුරා වර්ධනය කිරීම සඳහා එහි තත්වය තීක්ෂ්නව යොදා ගැනීමට කොන්ග්‍රස් පක්ෂය නායකත්වය දෙන යූපීඒ ආන්ඩුවට හැකි වෙතැයි එය බලාපොරොත්තු වෙයි.

න්‍යෂ්ටික ගිවිසුම මුහුදුබත් වේ ද යන්න බලා ගැනීමට තව කල් ගත වන අතරේ ම, තම භූ-දේශපාලනික උපායන්ට ඉන්දියාව මෙහෙයවා ගැනීමේ වොෂින්ටනයේ ප්‍රචන්ඩ ක්‍රියාකාරීත්වය දැනට ම පෙන්වා දී ඇත්තේ එවන් ක්‍රියා දාමයක් කෙතරම් භයානක ද යන්නත් එමගින් සුපිරි බලයන් හා සුපිරි බලයන් වීමට යත්න දරන්නන් අතර සබඳතාවන් වැඩි වැඩියෙන් බිඳෙනසුලු බවට හා පුපුරනසුලු බවට පත් කෙරෙන ආකාරයත් ය.

© www.wsws.org